# කුවේණියගේ දරුවන්ගේ දරුවෝ: වැදි ජන නායකයන් විසින් මහාවංශ ආඛ්‍යානයන් බැහැර කිරීම ප්‍රතිරෝධී අනන්‍යතාවක් ලෙස

**ප්‍රභාත් ගලගමගේ**
**ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**
***gprabath@gmail.com***

වැදි ජනයා පැවතෙනුයේ කුවේණියගේ දරුවන්ගෙන්ය යන්න මහාවංශය ඔස්සේ ගලා එන වැදි ජනයාගේ පොදු සම්භවය පිළිබඳ ප්‍රමුඛ ආඛ්‍යානයයි. එහෙත් වැදි ජනයාගේ නායකයෝ ඔවුන්ගේ මතවාදයන්ගේ ආභාසය ලත් වැදි ජනයා මෙම ආඛ්‍යානය ප්‍රතික්ෂේප කරති. ඔවුන් සඳහන් කරන්නේ වැදි ජනයාගේ සම්භවය එයට වඩා බොහෝ දුරාතීතයට ගමන් කරන බවයි. පොදු සම්භවය පිළිබඳ අධිපති සංස්කෘතිය විසින් නිර්ණය කරන ලද ප්‍රවාදයන් ආදිවාසී ජනයා විසින් බැහැර කිරීම සඳහා පසුබිම සැකසෙන්නේ වර්තමානයේ සිදුකර ඇති පුරාවිද්‍යාත්මක ගවේෂණ ප්‍රමුඛ කොටගත් ලංකා ඉතිහාසය පිළිබඳ නව අනාවරණයන් හා සමගාමීවය. කෙසේ වෙතත් ජනවාර්ගික හෝ සාමූහික අනන්‍යතාවන් හඳුනා ගැනීමේදී වැදගත් වන ප්‍රධාන මානයක් වන පොදු සම්භවය පිළිබඳ ආඛ්‍යානයන් ප්‍රතිනිර්මාණය වන / ප්‍රතිසංස්කරණය වන හා "අනෙකා" විසින් ගොඩනගන ලද තමන් පිළිබඳව වන ආඛ්‍යානයන් බැහැර කරලන මෙම අවස්ථාව වැදි ජනයාගේ ජනවාර්ගික හැඩතලයන්ගේ අනාගතය පිළිබඳව සිදුකරන ගවේෂණයකදී ඉතා වැදගත් වෙයි. මේ අනුව මෙම පත්‍රිකාව තුළින් ඉදිරිපත් කරන්නේ දර්ශනපති උපාධි පර්යේෂණ ව්‍යාපෘතියක අනුකොටසක් ලෙස අධ්‍යයනයට ලක්වූ ක්ෂේත්‍රයකි.

මෙය දඹාන, හෙන්නානිගල හා රතුගල යන ආදිවාසී ජනපද ආශ්‍රිතව සිදුකර ඇති සහභාගිත්ව නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡාවන් ප්‍රධාන ලෙස දත්ත රාශිකරණ ක්‍රමවේදයන් ලෙස යොදාගෙන ඇති පර්යේෂණයක් වේ.

අධ්‍යයනයෙන් පැමිණිය හැකිවන නිගමනය වන්නේ වැදි ජන නායකයන් විසින් සිය සම්භවය පිළිබඳ මහාවංශය ආඛ්‍යානය ප්‍රතික්ෂේප කිරීම ප්‍රතිරෝධී අනන්‍යතාවක් ලෙස හැඳිනගත හැකි බවයි. එසේම එය තවදුරටත් විස්තාරණය කළහොත් "ආදිවාසී දේශපාලනයක" හැඩතලද ඒ තුළ හැඳිනගත හැක. මෙම සංසිද්ධිය ආදිවාසී ජනයා ගේ ජනවාර්ගික පැවැත්මේ පරිවර්තනයන් පිළිබඳව සිදුකරන අධ්‍යයනයක දී එහි ගමන්මග පිළිබඳ නිගමනය සඳහා ද ආලෝකයක් සම්පාදනය කරනු ඇත.

***ප්‍රමුඛ පද:*** *වැදි ජනයා, ආදිවාසීත්වය, ආදිවාසී දේශපාලනය, පොදු සම්භවය, අනන්‍යතාව*